# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2378/37 - 2024 අප්‍රේල් මස 05 වැනි සිකුරාදා - 2024.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/11/2021/CEB/405.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : DS/VAV/ADM/LAND/AQ-CEB/KATH.SK/2022/08/001.

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් භුක්ති අයිතිය පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත් එය ලබා ගැනීමට රජය අදහස් කරන බවත් 1964 වර්ෂයේ අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ / සංශෝධිත පනත යටතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මම මෙයින් දන්වා සිටිමි.

*අත්කර ගැනීමට නියමිත ඉඩමෙ හෝ භුක්ති අයිතිවාසිකමෙ විස්තරය* :

උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාර්තාසින්නකුලම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කරුවල්පුලියන්කුලම් ගමේ පිහිටා ඇති සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 950089 හි කලාප අංක 11 හා 2023.12.28 දින දරන කැඩැස්තර පිඹුරෙහි සඳහන් කැබලි අංක 2,3,4,5,6,7,8,9 සහ 10 වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 6.1314 පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති ඉඩම්.

01. **කැබලි අංක 02**

ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: එස් විදූෂන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5218.

*උතුරට* : කැබලි අංක 1 පාර (R.D.A.) Toppo pp 73 හි කැබලි අංක 264 ; *නැගෙනහිරට*: Toppo pp 73 හි කැබලි අංක 264, කරුවලපුලියන්කුලම් (කොටසක්) සහ කැබලි අංක 9; *දකුණට* : කැබලි අංක 9 සහ 3; බටහිරට : කැබලි අංක 9 සහ 1 පාර (R.D.A.)

02. **කැබලි අංක 03**

ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: ඒ. සිවානන්දකුමාර්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5969.

*උතුරට* : කැබලි අංක 1 පාර (R.D.A.) සහ කැබලි අංක 2; *නැගෙනහිරට*: කැබලි අංක 2 සහ 9; *දකුණට* : කැබලි අංක 8, 9 සහ 4; බටහිරට : කැබලි අංක 4 සහ 1 පාර (R.D.A.)

1A - G041711 – 36 (2024/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. කැබලි අංක 04
ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: ටී. අමිර්තලිංගම්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.6004.

*උතුරට* : කැබලි අංක 1 පාර (R.D.A.) සහ කැබලි අංක 3; *නැගෙනහිරට*: කැබලි අංක 3, 9 සහ 8; *දකුණට* : කැබලි අංක 8, 7 සහ 5; බටහිරට : කැබලි අංක 1 පාර (R.D.A.)සහ කැබලි අංක 5.

04. කැබලි අංක 05
ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: ඊ. මනෝහරන් සහ ලලිතා මනෝහරන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5014.

*උතුරට* : කැබලි අංක 1 පාර (R.D.A.) සහ කැබලි අංක 4; *නැගෙනහිරට*: කැබලි අංක 4, 8 සහ 7; *දකුණට* : කැබලි අංක 7 සහ 6; බටහිරට : කැබලි අංක 1 පාර (R.D.A.) සහ කැබලි අංක 6.

05. කැබලි අංක 06
ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: ඊ. රාජේස්වරන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3212.

*උතුරට* : කැබලි අංක 1 පාර (R.D.A.) සහ කැබලි අංක 5; *නැගෙනහිරට*: කැබලි අංක 5 සහ 7; *දකුණට* : කැබලි අංක 7, කරුවලපුලියන්කුලම් (කොටසක්) සහ Toppo pp 73 හි කැබලි අංක 292 හි කොටසක්; බටහිරට : කැබලි අංක 1 පාර (R.D.A.) සහ Toppo pp 73 හි කැබලි අංක 292 හි කොටසක්.

06. කැබලි අංක 07
ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: එම්. යෝගේෂ්වරන්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5915.

*උතුරට* : කැබලි අංක 4, 5 සහ 8; *නැගෙනහිරට*: කැබලි අංක 8 සහ 10; *දකුණට* : කැබලි අංක 10 සහ කරුවලපුලියන්කුලම් (කොටසක්); බටහිරට : කරුවලපුලියන්කුලම් (කොටසක්), Toppo pp 73 හි කැබලි අංක 293 හි කොටසක්, කැබලි අංක 6 සහ කැබලි අංක 5.

07. කැබලි අංක 08
ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: ටී. පරදලිංගම්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4985.

*උතුරට* : කැබලි අංක 4, 3 සහ 9; *නැගෙනහිරට*: කැබලි අංක 9 සහ 10; *දකුණට* : කැබලි අංක 10 සහ 7; බටහිරට : කැබලි අංක 7, 5 සහ 4.

08. කැබලි අංක 09
ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: නොදනී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4530.

*උතුරට* : කැබලි අංක 2, 3 සහ කරුවලපුලියන්කුලම් (කොටසක්); *නැගෙනහිරට*: කරුවලපුලියන්කුලම් (කොටසක්) සහ කැබලි අංක 10; *දකුණට* : කැබලි අංක 10 සහ 8; බටහිරට : කැබලි අංක 8, 4, 3 සහ 2.

09. කැබලි අංක 10
ඉඩමේ නම: - ; විස්තරය: හිමිකම් කියනු ලබන අයගේ නම: කේ. ක්‍රිෂ්නමූර්ති සහ එම් ත්‍යාගරාජා; ප්‍රමාණය: හෙක්ටයාර් 2.0467.

*උතුරට* : කැබලි අංක 9 සහ කරුවලපුලියන්කුලම් (කොටසක්); *නැගෙනහිරට සහ දකුණට* : කරුවලපුලියන්කුලම් (කොටසක්); බටහිරට : කරුවලපුලියන්කුලම් (කොටසක්) සහ කැබලි අංක 7, 8 සහ 9.

අත්පත් කර ගැනීමේ අරමුණ : පිවිතුරු බලශක්ති ලබා ගැනීම සඳහා වූ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය යටතේ යෝජිත වවුනියාව 220/132KV ග්‍රිඩ් උපපොල තැනීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

ඉහත සඳහන් ඉඩමවලට භුක්ති හිමිකම් අත්කර ගැනීමට නියමිත ඉඩමට හිමිකම්පාන සියලුදෙනාම තමන්ම හෝ විධිමත් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයකු මගින් 2024 වර්ෂයේ මැයි මාසයේ 31 වැනි දින පෙරවරු 10.00 ට වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රැස්වීම් ශාලාවේ දී මා ඉදිරිපිට ප්‍රකාශ කරන ලෙස ද එම ඉඩම පිළිබඳව ඔහුට ඇති හිමිකම්වල ස්වභාවය ද දක්වා ඇති ඉඩමේ භුක්ති/ අයිතිවාසිකම් අත්කර ගැනීමේ වන්දි පිළිබඳව ඔවුන්ගේ ඉල්ලීම්වල විස්තර ද වන්දි මුදල ද එම මුදල ගණනය කළ විස්තර ද 2024 වර්ෂයේ මැයි මස 22 වැනි දිනට පෙර ලිඛිතව පිටපත් තුනකින් (03) යුක්තව මා වෙත දන්වන ලෙස ද මෙයින් ඉල්ලා සිටිමි.

**එන්. කමලදාසන්,**
ප්‍රාදේශීය ලේකම්,
වවුනියාව.

2024 මාර්තු මස 27 වැනි දින,
වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

EOG 04-0036

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: 4/1/1/29.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/7/2016/HW/125.

උක්ත ශීර්ෂය යටතේ 2020 දෙසැම්බර් මස 04 වැනි දින මවිසින් අංක 2204/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රය යටතේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමෙහි මු.පි.කු. 2433 හි කැබලි අංක 143 දරන ඉඩම් කොටසෙහි බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0038 ලෙස 27A පිටුවෙහි සඳහන් කර ඇත. එය ඉවත් කොට බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0041 ලෙස ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉවත් කළ යුතු බිම් ප්‍රමාණය
හෙක්ටයාර් 0.0038

ඉවත් කළ යුතු බිම් ප්‍රමාණය වෙනුවට ආදේශ කළ යුතු බිම් ප්‍රමාණය
හෙක්ටයාර් 0.0041

ඩබ්ලිව්. එස්. සේනාතිස්ස,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල.

2024 මාර්තු මස 22 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04-0037

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2014/WS/233.
*යොමු අංකය*: KMB/LAN/ACQUI/2/60.

අංක 2363/88 හා 2023.12.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමෙහි ඉඩමට හිමිකම්/ අයිතිවාසිකම් කියාපෑම සඳහා සම්මුඛ වියයුතු දිනය 2024.06.10 වැනි දින ලෙස හා වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටි පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුත්තේ 2024.06.03 වැනි දිනට මත්තෙන් යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

චින්තා. පී. ඩබ්. වන්නිආරච්චි,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කඹුරුපිටිය.

2024 මාර්තු මස 22 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල යේ දී ය.

EOG 04-0038

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: DSB/LND/03/FI/35/XXVI-14/2021.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2019/HW/418.

බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් වන මම, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2293/31 හා 2022.08.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කහවත්ත ගමේ අ.ග.පි. 291 අතිරේක අංක 34 පත්‍ර අංක 25 හා 2021.07.28 දිනැති සැලැස්මේ කැබලි අංක 969 ලෙස සඳහන් ඉඩම අත්කර ගැනීමට අදාළව පළ කරන ලද දැන්වීමෙහි වන්දි පරීක්ෂණ දිනය අවලංගු කරන අතර නව වන්දි පරීක්ෂණ දිනය 2024.06.06 දින හා වේලාව පෙ.ව. 10.00 ට බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ලෙස සංශෝධනය විය යුතු බවත් අදාළ ලේඛන 2024.05.30 දිනට මත්තෙන් මා වෙත භාර දිය යුතු බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ජීවනී ගංගා රුවන්පතිරණ,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
බෙලිඅත්ත.

2024 මාර්තු මස 07 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04-0039

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.